

# කළු ලේඛකයන් දකින කළු ඕස්ට්‍රේලියානුවා

මාබෝ නඩු තීන්දුව ඔස්ට්‍රේලියාවේ ඉතිහාසයේ අතිශය වැදගත් සිදුවීමකි. එම ඓතිහාසික තීන්දුව ප්‍රකාශයට පත්කොට දස වසරක් පිරීම නිමිත්තෙන් අපේ මෙල්බර්න් ගුවන් විදුලි සේවයෙන් ඒ ගැන කතා කරන්නට මම සිතීමි. ගුවන් විදුලි සේවයේ කැඳවුම්කරුට කතා කොට ඒ සඳහා විනාඩි පහක් ඉල්ලා සිටියෙමි. එයට එකඟ වූ ඔහු වැඩසටහන් කාලය තුළ දුරකතනයෙන් මා අමතන්නට පොරොන්දු විය. හරියට විනාඩි පහකින් කියන්නට කරුණු සූදානම් කරගෙන මම බලා සිටියෙමි. දුරකතනය නාද වූයේ දවසේ වැඩසටහන් හමාර වන්නට විනාඩි දහයක් තියාය. එය ප්‍රශ්නයක් නොවීය. එහෙත් මා විනාඩි දෙකක් කතා කරන්නට පෙර මා සමඟ පිළිසඳරට හවුල් වූ නිවේදකයා හදිසි කරන්නට පටන් ගත්තේය. වෙලාව නැති බව දිගින් දිගටම කියන්නට විය. ඔයින් මෙයින් මට විනාඩි හතරක්වත් කතා කරන්නට බැරි විය.

මෙම නිවේදකයාගේ හදිසියට හේතුව අල්ලා ගන්නට මට හැකි වූයේ කලකට පසු. එයා මාබෝ කියන්නේ තුමක්ද කවුද යන්න නොදැන මාබෝ නඩු තීන්දුවේ වැදගැම්ම දැන ගන්නට බැරිය. ඔහු ඒ කිසිවක් දන්නේ නැත. එහෙත් මටත් කලින් ඔස්ට්‍රේලියාවට සම්ප්‍රාප්ත වූවෙකි.

මෙම අත්දැකීම මට සිහිපත්වූයේ ලක්ෂ්මන් කොඩිතුවක්කුගේ 'පැය අටේ මිත්‍රයෝ' කියවද්දීය. අපේ බොහෝ ලේඛකයන් නොදන්නා නැතහොත් නොතකන විෂයක් ගැන ලියූ කවක් එහි ඇතුළත්ය. 'ආදිවාසීන්ගෙන් අපේ ඇත්තන්ට පණිවිඩයක්' යන රචනාවෙහි ලා, කවියා අපේ ඇත්තන්ට මතක් කරදෙන කරුණු කිහිපයක් වැදගත්ය.

ඒ හිරු සඳතරු හිමි නැති
පුරවැසියෙක්මි මෙමන් මෙමනාදීපේ
සහතිකයක් ලබා නොගත්
කිසිවෙකුගේවත් දෑතින්"

පුරවැසි සහතික පත් ලබා ගත් සංක්‍රමණිකයන්ට ආදිවාසියා මතක් කර දෙන එක් සත්‍යයකි . ඒ මෙම මහද්වීපය නිජබිම කොට ගෙන යටත් පිරිසයින් වසර පනස් දහසක් වත් වාසය කළ ජනතාවකට ඊයෙ පෙරේදා අහම්බෙන් මේ දේශයට ගොඩ වුවත් අතින් සහතික ගන්නට වුවමනාවක් නැත.

එසේ මේ මහ පොළොව උරුම කරගත් ජනතාවකට එය අහිමි කරමින් සුදු ජාතිකයන් විසින් ඒ කමතිකම පනවා තිබූ - ටෙරා නොලියස්" තහංචිය නොහොත් මිථ්‍යාව බිඳ හෙළමින් මෙරට මහාධිකරණයේ සුදු විනිසුරුවන් විසින් ම දෙන ලද විනිශ්චයයි 'මාබෝ තීන්දුව' නමින් ඔස්ට්‍රේලියාවේ ඉතිහාසයෙන් සටහන් වන්-
න්.
තීන්දුව ලැබුනාට ආදිවාසීන්ගේ දුක් වේදනා හමාර වූයේ නැත. ඔවුන් වී සිටින අසරණ තත්වය වෙනස් වූයේ නැත. ඒ නිසාය අළුතින් ආවුන් දියුණු වෙමින් සතුටින් දිවි ගෙවනු දැක මොවුන් කම්පාවට පත්වන්නේ.

මේ කොඩිතුවක්කු ආදිවාසීන්ගේ මුවට තබා එය කියන ආකාරයයි.

උන් අතින් සහතික පත් ලැබූ
මිනිසුන් තුටු වෙන අයුරු දැක
මම ද සිනාසෙමි ගලන දිය දහරක
දිස්වන සෙලවෙන
මගේ ම අසරණ රුව සමග"

තවත් අපේ කවීන් මෙම මිනිස් කොටස් ගැන ලියා ඇද්දැයි මම සොයා බැලුවෙමි. එක් කවියෙක් මට හමු විය. ඒ මෑතකදී 'මතක

**<u>කෙසේ ලියුවද මෙරට දිවිය අලලා කරන සාහිත්‍ය නිර්මාණයක් සඳහා මේ රටේ සමාජයත් ඉතිහාසයක් පිළිබඳ අවබෝධයක් තිබීම අවශ්‍යය.</u>**

දිවයින' ලියූ සුනිල් ගෝවින්නගේය. ගෝවින්නගේ දකින්නේ ද ආදිවාසීන්ගේ දුක ය - පරිහානිය ය. ඔහු දකින්නේ පර්ත් නුවර වීදි කොණක බමන ගතින් සැරි සරණ කළු මිනිසෙකි. ඔවුන්ගේ ඉතිහාසය ද කවියාට මතක් වෙයි.

-නුඹ නිදනා කල දහවල
රෑ යාමෙහි ආ සිහිනය
අවුරුදු හතලිස් දහසක
උරුමය ගැන කියන කතා
කුමන අරුත් කියා දේද?

බමන ගතින් නෑයන් නුඹ
වීදි පුරා සරනා විට
සුදු මිනිසුන් දොඩනා කතා
කටු පඳුරක උල් වගේ ද?
කළු - සුදු වූ ඉතිහාසය
ගැන ලියවුණ අකුරු පේලි
සිර මැදුරක යදම් වැනි ද?

එම කවි පෙළ 'සුදු කළු වූ ඉතිහාසය' යන හිසින් රචිතය.

මෙරට වසන අපේ අනෙක් කවීන්ගේ රචනාවල ආදිවාසීන් ගැන ලියූ කවි දුටු බවක් මට මතක නැත. කෙටි කතා කරුවන් සේ නිමැවුම් කෙරෙහි ද සිත යොමු කළෙමි. කැන්බරාවාසී පියසේන පියසිරි ලියූ 'රටකින් එහා' නමින් වූ කෙටි කතා එකතුවේ එක් කතාවක ඔවුන් ගැන සඳහනක් ඇතැයි සිතමි. 'වැල්වටාරම්' නම් කතාව අසල් වැසි සුදු මිනිසා ගැන කියවෙන්නකි. එහි එන ජේදයක් මෙසේය.

''මී ළඟ සති අග වයස්ගත දෙමාපියන් ඔහු බැලීමට පැමිණ සිටියහ. එම පරම්පරාවේ ඉතාහාසය නොමිලේ අතට ගැනීමට අවශ්‍ය නම් ඔබ කළ යුත්තේ වැට අසලට යාමය. රජයේ ඉඩම් අල්ලා ගත් ජනපදිකයෝ වැද්දන් මරා දමා බැටළුවන් ඇති කළ හැටි - වන කතා - මොර කතා - බණ කතා"

මෙහි සඳහන් වැද්දන් ආදිවාසීන් බවට සැකයක් නැත. සමහරවිට ඔස්ට්‍රේලියානු ආදිවාසීන් හා ශ්‍රී ලංකාවේ වැදි ජනයා අතර පැරණි සබඳතාවක් ඇතැයි කියන අදහස අනුව මෙසේ ඔවුන් හඳුන්වන්නට පියසේන පියසිරි සිතන්නට ඇත.

මෙහි දී අප ලියන පොත පත ශ්‍රී ලාංකික පාඨකයාගේ විශේෂ අවධානයට ලක්වන්නට -



## කස්තිරම

**ඩී බී කුරුප්පු**

සිංහල සාහිත්‍යයේ විෂය සීමාව පුළුල් කරන්නට - මේ රටට සුවිශේෂ වන දේ ගැන ලිවීම එක් මගක් විය හැකිය. එක් අතකින් මෙරටටම විශේෂ වූ ස්වභාවික සෞන්දර්යය - සතා සිව්පාවා ගැන, තවත් අතකින් මෙරට සමාජ ඉතිහාසයේ විශේෂතා ගැනද ලිවීම ප්‍රයෝජනවත් විය හැකිය. කෙසේ ලියුවද මෙරට දිවිය අලලා කරන සාහිත්‍ය නිර්මාණයක් සඳහා මේ රටේ සමාජයත් ඉතිහාසය-ක් පිළිබඳ අවබෝධයක් තිබීම අවශ්‍යය. ආදිවාසීන් නොමැති ඉතිහාසයක් මේ රටට නැත. සුදු මිනිසුන් පදිංචියට ආ පසුව මෙරට ඉතිහාසයක් සෑහෙන කොටසක් ආදිවාසීන් සමඟ ගැටුම් හා ඔවුන් කොන් කර දැමීම සම්බන්ධ වන්නකි.

අනෙක් අතට, බහු සංස්කෘතික සමාජයක් හැටියට ඔස්ට්‍රේලියානු සමාජය වටහා ගැනීමෙහි ලා නොතකා හළ නොහැකි අංශයකින් ආදිවාසී සංස්කෘතිය සිය ගණනකැයි කිව හැකි අනෙත් පෙර-අපර දෙදිග සංස්කෘතීන් නොතකා හළ යුතු ද නොවේ. ඒවා ගැන සැලකිලිමත් වන අතරම, ඒ හැම සංස්කෘතියකට ම අයත් වුවන් අද සැපවත් - දියුණු - ජීවිතයක් ගත කරන්නේ මුල ආදිවාසීන්ගේ නිජ බිම මත බව අප අමතක නොකළ යුතුය.




## කවි කොළය

*ඇක්ටර් තුමා පිළිබඳ වසරේ හොඳම*
*විනිසුරු මඬුල්ලට තව මොන කතාවද?*
*නවනළු රසය පිරි නූතන දුටු ගැමුණු*
*චරිතය සජීවිව පෙන්වපු එකම මදෑ!*

*කවදත් පිදිය යුතු ඇත්තන් පුදන රටේ*
*මදි පාඩුවක් කෙරුවොත් හරි අපරාදේ*
*දීලා තවත් ලොකු කැබිනට් ඇමතිකමක්*
*ඩොක්ර්, ඩබල් ඩොක්ටර් කළ යුතුව ඇත*

*වෙත්තසිංහ*

STANHOPE PRINTING
FOR OFFSET AND DIGITAL PRINTING
සිඩ්නි සහ මෙල්බර්න් ශ්‍රී ලාංකිකයනට කදිම අවස්ථාවක්

- Labels
- School Magazines
- News Letters
- Business Stationery
- Annual Reports
- Special Publications
- Posteres
- Brochures
- Greeting Cards
- Business Cards
- Flyers
- Price Lists

ALL YOUR PRINTING NEEDS....

ඔබගේ සියලුම මුද්‍රණ කටයුතු සඳහා පහත සඳහන් අංකයනට අමතන්න

මුද්‍රණ ඇණවුම් සඳහා තැපැල් ගාස්තුවලට අයකිරීමක් නොමැත

LAKSHMAN
TEL.(02) 9626 7660
MOB.0405287243